# ගොඩ මඩ ගොවිතැන් සරුකල රෝපන ද්‍රව්‍ය

ප්‍රවෘත්ති ප්‍රකාශන නිලධාරි **සරත්** දයානන්ද විසිනි.

පුරාතන ඉන්දියාවේ සහල් හැඳින් වූයේ ධාන්‍ය නමින්. 'ධාන්‍ය' යන්නෙහි තේරුම වූයේ "මානව වර්ගයාගේ පැවැත්ම සඳහා" යනුයි. ආසියාකරයේ අවුරුදු දහස් ගණනක සිට වී ගොවිතැන කළ අතර, මේ වී වර්ග අද ඔරයිසා සැටයිවා යන විද්‍යාත්මක නම භාවිතා වේ. මෙහි තවත් අතුරු බෙදීම් දෙකක් (අ) ඉන්ඩිකා (ආ) ජැපොනිකා නමින් ඇත.

ලෝකයේ වී පිළිබඳ ප්‍රධාන පර්යේෂණ මධ්‍ය ස්ථානය පිහිටුවා ඇත්තේ පිලිපීනයේ යි. එය ජාත්‍යන්තර සහල් පර්යේෂණ මධ්‍යස්ථානය නමින් ද හඳුන්වනවා. තේරීම් හා දෙමුහුම් මගින් නව වී වර්ග බෝ කිරීමට වී වර්ග 14 700 ක් පමණ එහි ගබඩාකොට තිබෙනවා.

ශ්‍රී ලංකාවේ ද වී පිළිබඳ පර්යේෂණයට දේශීය වී වර්ග 3,000ක් පමණ පර්යේෂණ මධ්‍යස්ථාන වල ඇතැයි සැලකෙනවා. ශ්‍රී ලංකාවේ වී පර්යේෂණවලට පදනමට මේවාද, අන්තර් ජාතික පර්යේෂණ වලින් නිපැයෙන නව වර්ග වල ප්‍රවේණියානු ද ප්‍රයෝජනවත් වෙනවා. පසුගිය අවුරුදු 40–50 තිස්සේ වී නිෂ්පාදනය වැඩි කිරීමට රජය ගත් හැම වැඩ සටහනකටම මූලික වූයේ ඒ වැඩ පිළිවෙලයි. මේ වැඩ සටහන් මෙසේ බෙදා දක්වන්න පුළුවන්.

අ. 1925–55: ප්‍රධාන වශයෙන් නුමුහුන් දේශීය වී ගොවීන් අතට පත් කිරීමටයි කටයුතු කළේ.

ආ. 1956–69; ඉතාම සුදුසු දේශීය උසැති වී වර්ගවල හොඳ ගුණාංග එකතුකොට වැඩි දියුණු වී බිහි කළා. මේවා 'එච්' වර්ගය යටතේ දක්වන්න පුළුවන්.

ඇ. 1969 සිට මේ දක්වා: පිලිපීනයේ බිහි කළ අයි.ආර්. වී වර්ග වල ප්‍රතිඵල උපයෝගී කරගෙන දේශීය තත්වයන්ට උචිත මිටි වී වර්ග බිහි කළා. නයිට්‍රජන් පෝර යෙදීමේ දී වැඩි අස්වනු ගෙන ඒමේ හැකියාවක් ඇති බීජ වර්ග මේ ගණයට අයිතියි.

වැඩි අස්වනු දෙන ගුණයට අමතරව තවත් අරමුණු කීපයක්ම තිබෙනවා. ඒවා නම්:

1. අඩු උෂ්ණත්වයක් ඇති කඳුකර ප්‍රදේශ වලට තත්වයන්ට සුදුසු වී වර්ග (රහන්ගල, පුස්සැල්ලාව යන ස්ථානවල.)

2. පහතරට තෙත් කලාපයේ දුර්වල ජලාපවහනය සහිත කුඹුරුවල විශේෂයෙන් සල්ෆයිඩ් විෂ වීමට ඔරොත්තු දෙන වී වර්ග. (බෝඹුවල, රත්නපුර, ලබුදූව යන ස්ථානවල.)

3. අහස් දියෙන් වැඩ කරන වියලි කලාපීය දේශගුණ තත්වයන්ට සුදුසු වී වර්ග (මහඉලුප්පල්ලම, පරන්තන් යන ස්ථාන වල.)

4. ගංවතුරට ඔරොත්තු දෙන වී වර්ග.



ගන්නෝරුවේ පිහිටි
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ පර්යේෂණ
ආයතනයේ පරීක්ෂාවෙන් ගොවි මහතුන්ට
සැපයෙන රෝපන ද්‍රව්‍ය ඉස්තරම් බවට
සහතික කරයි.

1958 වර්ෂය ඔබට මතක ඇති නම, ශ්‍රී ලංකාවෙ වැඩි දියුණු වී වර්ග ගැන 'ඉතිහාස ගත වර්ෂයක්'. මෙරට ගොවීන් හැමදෙනාගේම විශ්වාසය දිනාගත් 'එච් 4' බෙදහරින්නට වූයේ ඒ වසරේ සිටයි. ගොවි මහතුන්ට පළමු වරට දෙමුහුන් වී වර්ග ගැන වැටහීමක් ඇති වූයේ ද එතැන් සිටයි.

## බතලගොඩ

මේ අතර පිලිපීනයේ මිටි වී වර්ග බිහි වූවා. දේශීය උස වර්ග වලට නයිට්‍රජන් පොර යෙදීමේ දී වැඩි වූයේ ගොයම් කොළයි. නව පැලැටි සැලැස්මක් ඇතිව බිහි කළ අයි.ආර්. වර්ගයේ වැඩි වූයේ බරට නැමෙන වී කරලයි. දේශීය තත්වයන්ට උචිත මිටි වර්ග බතලගොඩ වී පර්යේෂනායතනයෙන් බිහිවන්නට පටන් ගත්තා. මේ වී වර්ග 'බීජී' නමින් හැඳින් වූවා. තුන්මස් වර්ගයක් වූ බීජී 34-8 අක්කරයකට සාමාන්‍ය අස්වැන්න බුසල් 140 ක්, බීජී 90-2 අක්කරයකට සාමාන්‍ය අස්වැන්න බුසල් 200 කුත් ලබා ගත්තා. මේවා අයි.ආර්. වර්ග වලටත් ඉස්තරම් වුනා. ඇත්ත වශයෙන්ම ඒවාට අන්තර් ජාතික සම්මාන පවා පිරිනැමුවා.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අළුත් වී හදන්නේ නැත්නම් අභිජනනය කරන්නේ ඒවාට කැප වී සිටින පර්යේෂණ නිලධාරීන්. පර්යේෂණ හා අත්හදා බැලීම් වලින් ඉහළම තැනට පැමිණෙන වී තෝරා ඊළඟට බෝ කරනවා. මේවා හඳුන්වන්නේ අභිජනන බීජ නමිනුයි. මේවායේ වර්ග පවිත්‍රතාවය 100% ක්ම තබාගෙනයි නිපදවන්නේ. ඊළඟට මේවා රජයේ ගොවිපළවල හෝ පර්යේෂණ ආයතනවල තවදුරටත් බෝ කරනවා. මේවා හඳුන්වන්නේ අත්තිකාරම් බීජ නමින්. ඊළඟට රටේ ලියාපදිංචි බිත්තර වී ගොවි මහතුන්ට බෙදා දීම සඳහා රජයේ ගොවිපළ වල තව දුරටත් බෝ කෙරෙනවා. මේවා හඳුන්වන්නේ ලියා පදිංචි බීජ නමිනි. ඒවායින් ඊළඟට සහතික කළ බීජ නිපදවීම සඳහා බිත්තර වී ගොවීන්ට බෙදා දෙනවා.

ඔවුන් නිපදවන බිත්තර වී මිළදී ගෙනයි සෙසු ගොවි මහතුන්ට නිකුත් කරන්නේ. අත්තිකාරම් බීජ නිපදවීමේ සිට සහතික බීජ නිපදවීම සඳහා ඉතා උසස් මට්ටමක් පවත්වා ගන්නවා. එහිදී වර්ග පවිත්‍රතාවය 99%කුත්, ප්‍රරෝහණය (අවම) 85% කුත්, අපවිත්‍ර ද්‍රව්‍ය (වැඩිම) 1% කුත්, වල් පැලැටි බීජ (වැඩිම) 0 .05% කුත්, තෙතමනය (වැඩිම) 13% කුත් යන මට්ටම් වලට ඉහළ විය යුතුයි. මේ පර්යේෂණ සිදු කරන්නේ විදේශාධාර ඇතිව 1959 දී පේරාදෙණියේ ගන්නොරුව පිහිටා ඇති බීජ පර්යේෂණ මධ්‍යස්ථානයේ දීයි.

### අද ශ්‍රී ලංකාවේ භාවිතා කෙරෙන ප්‍රධාන බීජ වර්ග සමහරක්.

| වයස් කාණ්ඩ | පැරණි වැඩි දියුණු වී වර්ග | | නව වැඩි දියුණු වී වර්ග | |
|---|---|---|---|---|
| මාස | වර්ග | පලදායිතාවය (අක්./බුස.) | වර්ගය | පලදායිතාවය (අක්./බුස.) |
| 3 | I. පච්ච පෙරුමාල් | 60 | I. බීජී 34-3 | 143 |
| | II. 62-355 | 80 | II. බීජී 33-2 | 123 |
| 3½ | I. වෙල්ලයි පෙරුමාල් | 60 | I. බීජී 34-6 | 130 |
| | | | II. බීජී 94-1 | 140 |
| 4-4½ | I. එච්. 4 | 110 | I. බීජී 11-11 | 150 |
| | | | II. බීජී 90-2 | 185 |
| | | | III. බී ඩබ්ලිව් 78 | 90 |
| | | | IV. එල්ඩී 66 | 90 |
| 5-5½ | I. පොඩි වී ඒ 8 | 60 | | |
| | II. පීටීබී 16 | | | |

1977/78 අස්වැද්දූ කුඹුරු අක්: 16,64,474 වගා කෙරේ යැයි ඇස්තමේන්තු කර තිබේ. මේවා විශාල වාරි මාර්ගයන්හි අක්කර 5,34 804 ක්ද, සුළු වාරිමාර්ග යටතේ අක්කර 4,59 964 ක් හා වැසි දියෙන් වගා කරන අක්කර 6,46,706 ක්ද වේ. ඊළඟට වැදගත් වන්නේ ගොවීන් මේ බිත්තර වී වගාවට ගුරුහරුකම් හා අනිකුත් සේවා සපයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති අංශය යි. වී වගාව සම්බන්ධව මේ අංශය සංවිධානය වී ඇත්තේ මෙසේ යි.

## බිත්තර වී

අ. ජාතික මට්ටමේදී: මූලස්ථාන නිලධාරින් ජාතික මට්ටමේදී අධ්‍යාපන හා පුහුණු කිරීම් කටයුතු. (ආ) වී නිෂ්පාදනය, අන්හද බැලීම් ආදී (ඇ) පැලෑටි සංරක්ෂණය (ඈ) බීජ නිෂ්පාදනය, සහතික කිරීම, ගබඩා කිරීම හා බෙද හැරීම.

ආ. දිස්ත්‍රික්ක මට්ටමේ දී: සැම දිස්ත්‍රික්කයකම දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන් යටතේ පහත සඳහන් විෂයයන් අළලා කටයුතු කරන විශේෂ කෘෂිකර්ම උපදේශක වරු සිටී. (අ) බිත්තර වී නිපදවීම හා බෙද හැරීම (ආ) වී නිෂ්පාදනය (ඇ) පැලෑටි සංරක්ෂණය.

ඇ. ප්‍රාදේශීය මට්ටමේ දී: ගොවි ජන සේවා මධ්‍යස්ථාන ප්‍රදේශයක් භාරව කෘෂිකර්ම උපදේශක වරයකු සිටී. මේ ප්‍රදේශයකට සාමාන්‍ය ගොවි පවුල් 3,000 - 5 000 ක්ද, කුඹුරු අක්කර 4,000 5,000 ක් පමණද අයත් ය.

ඇ. ගම් මට්ටමේ දී කලින් පැවැති ගොවිකාරක සභාව ප්‍රදේශයක් භාරව කටයුතු කරන්නේ කෘෂිකර්ම ව්‍යාප්ති සේවක තැනයි. මේ ප්‍රදේශයකට සාමාන්‍යයෙන් ගොවි පවුල් 600 1,000 ක් පමණ ද, කුඹුරු අක්කර 750–1,000 ද අයත් වේ යැයි සැලකිය හැකි යි.

ඒ ඒ දිස්ත්‍රික්කයේ ඒ ඒ වර්ගයේ බිත්තර වී කොපමණ නිෂ්පාදනය කරනවාද යන්න වසරේ කෘෂි කර්ම ක්‍රියාත්මක වැඩ සටහනෙහි ඇස්තමේන්තු කොට තිබෙනවා. සාමාන්‍ය වී ගොවි තැනට වඩා බිත්තර වී ගොවිතැනේදී බොහොම සැලකිලිමත්ව කටයුතු කළ යුතු යි. වියදමුත් වැඩි යි. ඒ නිසායි බිත්තර වී වැඩි මිලට මිල දී ගන්නේ. මෙතෙක් කල් කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිර්දේශයන්ට අනුකූල වන හැම බිත්තර වී නිෂ්පාදනයක්ම පාහේ මිල දී ගත්තා. නමුත් මෑතක සිට ඒ අන්දමින් කටයුතු කිරීම නොයෙකුත් හේතුන් නිසා අපහසු වෙලා තියෙනවා. එක හේතුවක් දිස්ත්‍රික්ක වලින් එක වී වර්ගයකට බලාපොරොත්තු වූ ඉල්ලීම නොයෙක් හේතුන් නිසා වෙනස් වීම. කාලගුණික තත්වයේ හදිසි වෙනස් වීම් නිසා, මේ වගේ වෙනස් වීම් සිදුවිය හැකි යි. වියලි කලාපයේ ගොවීන් එක කන්නයක මාස 3½ හෝ 4 වී වර්ග වගා කිරීමට බලාපොරොත්තු වූයේ යැයි සිතමු. නමුත් මහ කන්නයේ වැස්ස පසුගිය දිනවල වාගේ සති 2-3 පමා වුනා. එතකොට ගොවීන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ඉල්ලනවා මාස 3 ක වීයක්. ඒ වගේ කන්නයකදී කලින් තීරණයකට එළඹ නිෂ්පාදනය කෙරෙන බිත්තර වී විකුණා ගන්න එක දෙපාර්තමේන්තුවෙන් ලොකු ප්‍රශ්ණයක් වෙනවා. විශේෂයෙන් වැඩි දියුණුවී මාස නවයකට වඩා ගබඩා කර තබා ගන්න අපහසුයි. අනික් කරුණ සාමාන්‍යයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බැදීමක් නැහැ බිත්තර වී ගොවීන්ගේ නිෂ්පාදන මිල දී ගන්නට. සාමාන්‍යයෙන් මිල දී ගන්න බලාපොරොත්තු වෙන්නේ ලියා පදිංචි බිත්තර වී ගොවිපලක අක්කරයක නිෂ්පාදනයක්, නැත්නම් බුසල් 40 ක් පමණ යි නමුත් පසුගිය කාලේ මේ නීති රීති අකුරටම ක්‍රියාත්මක වුනේ නැහැ. මේ හේතු නොදන්නා නිසා විය හැකියි විශේෂයෙන් ම අම්පාර ගොවි මහතුන් තම බිත්තර වී විකුණා ගන්න නොහැකි වීම ගැන මැසිවිලි නගන්නේ.

සහතික කළ බිත්තර වී පරිභෝජනය සඳහා වී නිපදවන ගොවීන්ට සැපයීමේ ඇති ප්‍රශ්නය පලාතෙන් පලාතට වෙනස් වන ස්වරූපයක් ගත්තා. විශේෂයෙන් අම්පාර පොළොන්නරුව හම්බන්තොට, කුරුණෑගල වාගේ අතිරික්ත වී නිෂ්පාදන දිස්ත්‍රික්ක වලට බිත්තර වී සැපයීම ගැන ප්‍රශ්නයක් ඇති වන්නේ නැහැ. නමුත් ප්‍රශ්න මතු වන්නේ මහනුවර, නුවරඑළිය වාගේ හිඟ දිස්ත්‍රික්කවල ගොවි මහතුන්ට අවශ්‍ය බිත්තර වී සැපයීමේ දීයි.

විශේෂයෙන් නුවරඑළිය වාගේ කඳුකර දිස්ත්‍රික්කයක ගමන් පහසුව බෙහෙවින්ම අපහසුය.

කුඹුරු ගොවිතැන කෙරෙන්නේ කොත්මලේ, හඟුරන්කෙත, නිල්දණ්ඩාහින්න, වගේ ප්‍රදේශ වල පහත් නිම්න වලදී යි. කුඹුරු ගොවිපල වල් ඉතාම කුඩා යි. ඒ වගේ විසිරී ඇති කුඹුරු අක්කර 20,000 ක් පමණ තිබෙනවා මේ තත්වය යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ පසුගිය කන්නයට බිත්තර වී බුසල් 1,500 ක් පමණයි ගබඩා කර තිබුණේ. එක හේතුවක් බිත්තර වී සුළු ප්‍රමාණ ප්‍රවාහනයට ඇති අපහසුව. යල් කන්නය ගොවීන් කුඹුරුවල එළවළු වගා කිරීම ද, බිත්තර වී පොළොන්නරුව හිඟුරක්ගොඩ වාගේ දුරබැහැර පලාත් වලින් ලබා ගැනීමේදී ගොවීන් ලබා ගන්නා බිත්තර වී ප්‍රමාණය නොසලකා ගබඩා කර තැබීමෙන් වැඩි වියදමක් දරන්නට සිදු වීමත් නිසා ද, ඒවගේ ම ගබඩා පහසුකම්වල සීමාසහිත වීම ද ඒ තත්වයට හේතු වන කරුණු යි.

## නව වී වර්ග

ගොවීන්ගේත් වැඩි දියුණු වී වර්ග කෙරෙහි ඇති කැමැත්ත නොකැමැත්ත නොයෙක් හේතුන් නිසා වෙනස් වෙනවා. හොඳ ගොවීන් බොහොම දෙනෙක් විමසා බලා කෘෂිකර්ම ව්‍යාප්ති සේවක මහතාගෙන් උපදෙස් ලබාගෙන ඒ ඒ කන්නය යොදන බිත්තර වී වර්ග තීරණය කර ගන්නේ. තවත් අය පහසුවෙන් හොයා ගන්නා ඕනෑම බිත්තර වියක් යොද ගන්න පුළුවන්. මෙසේ දෙපාර්තමේන්තුවෙන් සහතික නොකළ වී වගා කිරීමේ වී ගොවිතැන් වලින් උපරිම පලයක් ලබාගන්න අපහසු යි. උදහරණයක් හැටියට 1977 යල කන්නයේ සිට යම් යම් හේතු නිසා 94/1 බිත්තර වී දෙපාර්තමේන්තුව නිකුත් කිරීම නවතා තිබෙනවා. ඒ වෙනුවට නිකුත් කරන ලද්දේ 94/2 යි. ඇත්ත වශයෙන්ම කියනවා නම් ඒකට හේතුව 94/2 වීය ටිකක් හොඳ වීයක් වීම යි. නමුත් අම්පාර දිස්ත්‍රික්කයේ ගොවි මහතුන් ඔවුන් හදගත් බිත්තර වී යොදගෙන 1977 යල කන්නයේ 94/1 වීය අක්කර 13,000 කුත්, 1977/78 මහ කන්නයේදී අක්කර 41,000 කුත් වගාකර තිබෙනවා. මෙ වගේ තත්වයක් සතුටුදායක ලෙස සලකන්න අමාරුයි. හේතුව ඒවා ගොවීන්ම බෝකර වර්ග පවිත්‍රතාවය ආදිය ගැන නොතකා පාවිච්චි කළ බිත්තර වී වීම යි. විශේෂයෙන් සලකන්න ඕනෑ දෙයක් නම් හැම අවුරුදු තුනකට වරක් වත් අඩුම වශයෙන් දෙපාර්තමේන්තුවේ සහතික කළ බිත්තර වී ගොවිතැනට යොද ගන්න එක යි.

පිලිපීනයේ ජාත්‍යන්තර සහල් පර්යේෂණ ආයතනයත්, ආසියාකරයේ ගොවීන් මේ නව බිත්තර වී වර්ග වගා කිරීමෙන් උපරිම ප්‍රයෝජන ගන්න ඇති බාධක ගැන රටවල් ගණනාවක සොයා බලා තිබෙනවා. විවිධ ස්ථානවල පුද්ගලයින් වශයෙන් විවිධ වන ගොවීන් වගා කරන විට හොඳම වී වර්ග භාවිතා කළ ද ප්‍රතිඵල එක හා සමාන නොවන බව එහි දී ඔවුනට මනාව පෙනී ගොස් තිබුනා. ඇත්ත වශයෙන්ම ජල පාලනය පිළිබඳ අපහසුකම් සහිත සහ අධික කෘමි රෝග උවදුරු වැනි සීමාකාරි බාධක ඇති ප්‍රදේශවල ගොවීන් නව වැඩි දියුණු වර්ග කෙරෙහි එතරම් විශ්වාසයක් තබා නැත. තවත් සමහර අවස්ථාවල වෙළඳ පොළ ඉහළ මිලක් ලැබීමත්, කටට රහට කෑමට ගැනීමටත් හැකි වීම නිසා දේශීය වී වර්ග වවා තිබෙනවා තවත් සමහර රටවල ඇතැම් ගොවීන් වෙළඳ පලට වැඩි දියුණු වී වර්ගත් ගෙදරදොරේ ප්‍රයෝජනය සඳහා දේශීය වී වර්ගත්, වගාකර තිබෙනවා. පකිස්ථානයේ නිෂ්පාදනය කෙරෙන මනා සුවඳක් ඇති බාස්මති අඩු අස්වැන්න දෙන දේශීය වී වර්ගයක්. එහෙත් ඊට වෙළඳ පොළේ හොඳ මිලක් ලැබෙනවා ඇත්ත වශයෙන්ම පකිස්ථානය සැහෙන විදේශීය විනිමය උපයන මාර්ගයක් තිබෙනවා එම නිසා මෙම වී වර්ගය සැහෙන දුරට එරට වගා කෙරෙනවා.

අනික් කරුණ නව වැඩි දියුණු වී ගොවිතැන් කරන ගොවීන් ඒවා උදෙසා මනා කළමනාකරණ තත්වයක් පවත්වා ගන්නේ නැතිනම් වැඩි අස්වැන්නක් ගන්න බැරි බවත් හොඳින්ම පෙනී ගොස් තිබෙනවා. දකුණු පිලිපීනයේ මේ වී වර්ග වගා කළ ගොවීන් 50% කට වඩා අය තම කුඹුරට කිසිම පෝර යොද තිබුනේ නැහැ. තායිලන්තයේ පාකිස්ථානයේත් පෝර යොද තිබුනේ ගොවීන් 25% ක් පමණ යි. බොහෝ ස්ථානවල අඩු මට්ටමින් ජීවාන්ත පෝර යෙදීමට හේතු පැහැදිලිව කළ යුත්තේ භෞතික මෙන්ම සමාජ ආර්ථික කරුණුන් ආශ්‍රිතව ය. මෙයින් පෙනී යනවා ඇති බොහෝ තැන්වල ඇත්ත වශයෙන්ම නව වැඩි අස්වනු දෙන වී වර්ග වගාකර තිබුනේ ඒ වාගේ වැඩි අස්වැන්න පිළිබඳ ගුණය ගැන සලකනවාට වඩා කෙටි වයස් සීමාව සලකාගෙන යි.

අද ශ්‍රී ලංකාවේ උදවී ඇති අළුත්ම තත්වය ගොවීන්ගෙන් එසේ ඉහළ කළමනාකරණ තත්වයක් අවශ්‍ය නව වැඩි දියුණු වී වර්ග වලට වඩා පැරණි වැඩි දියුණු වී වර්ගයක් වන 'එච්4' බිත්තර වියට ප්‍රබල ඉල්ලුමක් ඇතිවී තිබීමයි. මෙකට ප්‍රධාන හේතුව පෝර මිල ඉහළ යාම යැයි දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ අදහස යි. 'එච් 4' ගොයමට අඩු පෝර යෙදුමකට හා අනිකුත් කළමනාකරණ තත්වයන්ට ඔරොත්තු දෙන්නට හැකි වීම ඊට හේතුව යි.

# පලතුරු

පලතුරු: පලතුරු වගා රටාව ප්‍රධාන ආර්ථික අංශ දෙකක් හා බැඳී ඇත්තේ යැයි පවසන්නට පුළුවන්. එක අතකින් ගෙවතුවල ඉබේම වාගේ පැලවී පල දරණ පලතුරු ගස්. අනික් අතින් වෙළඳ පොළ ඉලක්ක කර වවන පලතුරු වගාවන්. ශෙවතු වල හොඳින් තේරු පැලයක් වවා ගන්නේ කලාතුරකින්. මෙරට දේශගුණ තත්වයන් අනුව සලකන විට නිවර්තන, උෂ්ණ නිවර්තන හා සෞම්‍ය කලාපීය පලතුරු වර්ග ගණනාවක් වගා කරන්නට පුළුවන්. කෙසේ වුවත් අද පලතුරු වගාව පවතින්නේ එතරම් දියුණු තත්‍වයකැයි කියන්නට අපහසු යි. මේකට හේතු කිහිපයක් තියෙනවා. ඒවා නම්;

අ. දේශීය තත්‍වයන්ට ගැලපෙන තෝරා ගත් උසස් වර්ගයේ පැලෑටි සොයා ගැනීමට ඇති අපහසුතාවය.

ආ. දේශීය තත්‍වය යටතේ පලතුරු වගා පාලනයේ වැදගත් කරුණු ගැන මනා අවබෝධයකින් තොරවීම.

ඇ. පලතුරු වගා පිළිබඳ පුහුණු ව්‍යාප්ති සේවකයින් ප්‍රමාණවත් නොවීම.

ඈ. පලතුරු උදෙසා වඩා හොඳ වෙළඳ පොලක් හා ප්‍රවාහන පහසුකම් නොති-බීම.



බද්ධ කළ හොඳ අඹ පැලයක් සොයා ගන්න මාස ගණනක් තිස්සේ බල බලා හිටිය. අද තමයි ගොවිජන සේවා මධ්‍යස්ථානෙට පැල කීපයක් ආවේ.—මෙසේ පැවසුවේ නාරම්මල යූ. ජී. ගුණරත්න මහතායි.

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උද්‍යාන බෝග අංශ විශේෂයෙන් පලතුරු සම්බන්ධව මෙරට පර්යේෂණ කරනු ලබයි. එහි දී ඒ ඒ පැලෑටිවල යෝග්‍යතාවය, බද්ධ කිරීම, රෝග ආදිය සම්බන්ධ අවධානය යොමු වී තිබේ. දැන් විශේෂ වැඩ සටහනක් යටතේ පලතුරු වර්ග හතක්. එනම්: අඹ, අන්නාසි, පැෂන්ෆෲට්, දෙඩම්/දෙහි, කෙසෙල්, පැපොල් හා අලිගැට පේර වගාවන් වැඩි දියුණු කිරීමටත් පුළුල් කිරීමටත් වෙර දැරේ. මේ එක එක පල තුරු වගාව ගැන විශේෂ පර්යේෂණ වැඩසටහන් තියෙනවා. උදහරණයක් හැටියට කෙසෙල් ගතහොත් ඒ පිළිබඳ පර්යේෂණ වැඩ සටහනට (අ) ක්ලෝන තේරීම හා ප්‍රවේණියානු ගබඩා පිහිටුවීම. (ආ) රෛන්ද්‍රිය පෝර හා වාරිමාර්ග ජලය සැපයීම. (ඇ) ජනප්‍රිය කෙසෙල් වර්ග වලට අවශ්‍ය පෝර. (ඈ) කෝලිකුට්ටු කෙසෙල් වල 'ගැට' ඇතිවීමේ රෝගය. (ඉ) ඇඹුල් කෙසෙල් වගා පිළිවෙත්. (ඊ) වර්ග ප්‍රභේදනය. (උ) කෙසෙල් පළිබෝධ, රෝග මර්ධනය හා පිළියම් යනාදිය ගැන හැදෑරීම අයත් වෙනවා.

අද වගා කෙරෙන පලතුරු වගා දෙස බැලූ-වහම කෙසෙල් අක්කර 62,000, අඹ අක්කර 27,000, අන්නාසි අක්කර 9,300 ක්, දෙඩම්/දෙහි අක්කර 4,600 ක්, වැල් දෙඩම අක්කර 1,250 ක් පමණ වගා වී ඇතැයි සැලකෙනවා. කෙසේ වුවත් වැඩි දියුණු පැල, එනම්: බද්ධ කළ පැළ සම්බන්ධයෙන් සැලකෙන විට විශේෂයෙන් වියලි කලාපීය දිස්ත්‍රික්ක වලින් අඹ පැළ වලට ඇත්තේ විශාල ඉල්ලුමක්. ඇස්තමේන්තු ගත මේ ඉල්ලුම් මෙසේ ය.

| | 78 යල | 78/79 මහ |
|---|---|---|
| අඹ – බද්ධ කළ පැළ | | |
| 1. කර්ත කොලොම්බන් | 24,870 | 65,422 |
| 2. වෙල්ලයි කොලොම්බන් | 9,769 | 22,772 |
| 3. විලාඩ් | 11,410 | 27,415 |
| 4. ගිරා අඹ | — | 10 |
| 5. අම්බලායි | 1,750 | 9,400 |
| 6. වෙම්බාර්ටන් | 1 110 | 550 |
| 7. පිටර්පාසන් | 1,020 | 1,360 |
| 8. ඩම්පරා | — | 60 |
| 9. නිලම් | 515 | 1,005 |
| 10. සැබරි | — | 100 |
| 11. පොල් අඹ | — | 100 |
| | 50,441 | 1,28,194 |

පසුගිය මහ කන්නයේ කුරුණෑගල, අම්පාර වගේ වියලි කලාපීය දිස්ත්‍රික්කයෙන් අඹ පැල වලට තිබුණු ඉල්ලුම 17,500 ක් පමණ වූ නමුත් ලබාගත හැකිවී තිබෙන්නේ අඹ පැල 250 ක් පමණ යි. ඊට හේතු රාශියක් තිබෙනවා. එකක් දිස්ත්‍රික්ක වලට අවශ්‍ය පැල සපයන්න කෙටි කාලයක් තුළ කළ නොහැකි යි. මන්ද? අඹ පැලයක් බද්ධ කර සකස් කරන්න අවුරුදු 2½ක් වත් ගත වෙනවා. ඇත්තවශයෙන් ම දූන් ඉල්ලුම් කරන්න ඕනෑ 1981 ට අවශ්‍ය අඹ පැල ප්‍රමාණය යි. මේ දිස්ත්‍රික්ක වල ඒ සම්බන්ධව දිගුකාලීන වැඩ පිළිවෙලක් අනුව සිදු වෙනවා ද කියන එක ප්‍රශ්ණයක්. අනික් කරුණ දූන් පොල් පර්යේෂණායතනය වගේ තැනක පොල් පැල තෝරා සකස් කරන්න අඩු ගණනේ අවුරුදු 1½ ක් කලින් අත්තිකාරම බඳින්න ඕනෑ. නමුත් දූන් එබඳු වැඩ පිළිවෙලක් කෘෂි කර්ම දෙපාර්තමේන්තුවේ නැහැ. මේ නිසා අඹ පැල විශාල ලෙස බද්ධ කර සකස් කිරීමේ ව්‍යාපාර යක් ගෙන ගියත් ඒක අවදානමක් දූරිමක් වෙනවා. ඒ කියන්නේ යම් හෙයකින් දිස්ත්‍රික්ක වලින් අඹ පැල මිල දී නොගත්තොත් ඒවායින් පාඩු වන නිසා. ඒ වගේම මේ අඹ පැල සකස් කරන රජයේ ගොවි පලවල රටේ අවශතාවය අනුව ආහාර බෝග වලට ප්‍රමුඛතාවය දෙන්නට සිදුවෙලා තියෙන්නේ. මේ අන්දමේ පැලෑටි ගොවි මහත්වරුන්ට සපයන පෞද්ගලික තවාන් පිහිටුවීමේ වැඩ පිළිවෙලක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තිබුණා. ඒ යටතේ තවාන් හිමියන් 40–50 ක් විතර බද්ධ පැලෑටි ආදිය සකස් කර විකුණූ අතර, දෙපාර්තමේන්තුවෙන් ඔවුනට උපදෙස් හා සේවාවන් සැපයූවා. දූන් මේ වැඩ පිළිවෙලට නව පනක් දීමට වැඩ පිළිවෙලක් සකස් කර තියෙනවා. ඒ අනුව පෞද්ගලික තවාන් කරුවනට වැඩි වගකීමක් ඉටු කරන්නට සිදු වෙනවා, රටට ඕනෑ පැලෑටි ද්‍රව්‍ය සැපයීම සම්බන්ධව.

## අර්තාපල්

**අර්තාපල්:** අද රටේ අවශ්‍යතාවයන් සපුරාලීමට හැකිවන පරිදි වසරකට අර්තාපල් ටොන් 70,000 ක් නිපදවීම මේ වගාවේ ඉලක්කය යි. අක්කරයක ටොන් හතක අස්වැන්නක් මත එම ප්‍රමාණය ලබා ගැනීමට අඩුම ගණනේ අක්කර 12,000 ක් වත් වගා විය යුතු යි. දූනට අර්තාපල් වගා කෙරෙන ප්‍රධාන දිස්ත්‍රික්ක බලන විට බදුල්ල අක්කර 6,000, නුවරඑළිය අක්කර 2,500 ක්, යාපනය අක්කර 2,000 ක්, වෙනත් අක්කර 1,500 ක්ද වේ.

බීජ අර්තාපල් නිෂ්පාදනය සඳහා ඇති බිම් ප්‍රමාණය වැඩි කිරීමට කෘෂි කර්ම දෙපාර්තමේන්තුව කටයුතු කරගෙන යයි. විශේෂයෙන් පෞද්ගලික ගොවීන්ගේ සේවය ද මීට ලබා ගැනේ. දූනට රජයේ බීජ අර්තාපල් ගොවිපල වල ප්‍රමාණය අක්කර 300 ට තරමක් වැඩිය. මෙම ගොවිපල වල බීජ අර්තාපල් ටොන් 1,500 ක් පමණ වාර්ෂිකව නිෂ්පාදනය කෙරේ. මෙපමණම ප්‍රමාණයක් පෞද්ගලික හා අනිකුත් ගොවිපල වල නිපද වේ. රටේ බීජ අර්තාපල් වල අවශ්‍යතාවය ටොන් 6,500 කි. අඩු ප්‍රමාණය පිටරටින් ආනයනය කෙරේ.

අනිකුත් බෝග මෙන් නොව, අර්තාපල් වල බෝවීම හෙවත් නිෂ්පාදන ප්‍රමාණය අඩු යි. උදහරණයක් හැටියට වී බුසල් 40–50 ක් නිෂ්පාදනය කිරීමට අවශ්‍ය වන්නේ බිත්තර වී බුසල් 2½ කි. එම නිසා නිෂ්පාදන ප්‍රමාණය 1 ට 20–25 අතර ය. අර්තාපල් ටොන් හයක නිෂ්පාදනයක් සඳහා බීජ අර්තාපල් හොණ්ඩර 18 ක් හෝ ටොන් 1 ක් පමණ අවශ්‍ය වේ. එම ප්‍රමාණය 1 ට 6 පමණකි. එහි ප්‍රතිඵලයක් වශයෙන් අවශ්‍ය බීජ අර්තාපල් නිෂ්පාදනය සඳහා විශාල බිම් ප්‍රමාණයක් අවශ්‍ය ය. ඌණතංශය අඩි 5,000 ට වඩා උස ප්‍රදේශ වලින් අවශ්‍ය වේ. ඒ රෝග වලින් නිදහස්ව තබා ගැනීම සඳහා ය. දේශීය බීජ අර්තාපල් බීජ නිෂ්පාදනය සීමා වීමට ප්‍රධාන කරුණු එබඳු සුදුසු ඉඩම් වල හිඟකම යි.

**1977/78 උදෙසා ආනයනය කළ බීජ අර්තාපල්.**

| | වර්ගය | ටොන් |
|---|---|---|
| 1. | අර්කා | 1,000 |
| 2. | බරාකා | 725 |
| 3. | බෙසිරි | 625 |
| 4. | නෙරඩස්ටර්න් | 500 |
| 5. | මිර්කා | 550 |
| 6. | ෆ්‍රැනල් | 25 |
| 7. | රෙඩ්බැඩ් | 5 |
| 8. | ඉස්නා | 5 |
| 9. | වෙකාරා | 5 |
| 10. | ලුක්‍රිටියා | 5 |
| 11. | ලෙසෝල් | 5 |
| | | 3,450 |

1950 ස් ගණන්වල සිට වගා කරන අර්කා වැනි වර්ග වලට වඩා බෙසිරී හා බරාකා වැනී නව වර්ග වඩා සුදුසු යැයි සැලකේ. මෙරට බීජ අර්තාපල් නිෂ්පාදනය කිරීම සඳහා දනට ඇති සැලැස්මවල් අනුව යෙදවිය හැකි බිම් ප්‍රමාණය මෙසේ ය.


| | රජයේ ගොවිපලවල් (අක්කර) | රජයේ සත්ව ගොවිපලවල් (අක්කර) | තේ වතු (අක්කර) | පුද්ගලික ගොවීන් (අක්කර) | එකතුව (අක්කර) |
|---|---|---|---|---|---|
| 1977/78 මහ | 150 | 25 | 30 | 50 | 275 |
| 78 යල | 300 | 25 | 135 | 200 | 600 |

නුවරඑළිය අර්තාපල් වගා කරන ප්‍රධාන දිස්ත්‍රික්කයකි. පසුගිය කාලවල බීජ අර්තාපල් බෙදහැරීම කළේ කෘෂිකාර්මික පලද වර්ධන කමිටු මාර්ගයෙනි. එහි දී සිදු වූ නොයෙකුත් අක්‍රමිකතාවයන් ඒ කාලයේ බොහෝ විට පුවත් පත්වල නිතර දකින්නට ලැබුණු දෙයකි. දන් නුවරඑළිය දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති කාර්යාලය හැම අර්තාපල් ගොවියෙකුට ම එක සමානව බීජ අර්තාපල් බෙද හැරීමේ කදිම වැඩ පිළිවෙලක් සකස් කර තිබෙනවා. එම වැඩ පිළිවෙලේ හැම පුරුකක දීම කෘෂිකර්ම උප දේශකවරයකු නැතිනම් කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයකුගේ පරීක්‍ෂාවට ද ලක් වෙනවා. මේ හේතුව නිසා ගොවින්ට අතන මෙතන ලත නොවී බීජ අර්තාපල් ලබාගන්න මඟ සැලසිලා. ඇත්තවශයෙන් ම මෙතෙක් මේ කන්නයේ කිසිම අර්තාපල් ගොවි මහතෙකුගෙන් පැමිණිල්ලක් ලැබිලා නැහැ.



සීතාඑළිය ගොවිපලේ නිපදවෙන බීජ අර්තාපල් වර්ගයක්

<u>නුවරඑළිය දිස්ත්‍රික්කයේ බීජ අර්තාපල් බෙදා හැරීමේ නව වැඩ පිළිවෙළ</u>



ගොවීන් වැඩි දෙනෙකු ගේ කැමැත්ත පිට රටින් ආනයනය කළ බීජ අර්තාපල් ලබා ගන්න. මොකද? ඒවායේ තත්වය වඩා හොඳ නිසා. නමුත් හැමවිටම නිලධාරීන්ට ආනයනය කළ බීජ අර්තාපල් සැපයීමට පුළුවන් කමක් නැහැ. දිස්ත්‍රික්කයට ලැබෙන 'කෝටා' එක අනුව බෙදා දෙන්න සිදු වෙනවා. පසුගිය කන්නය සඳහා ඉල්ලූ බීජ අර්තාපල් ටොන් 30 න් ලැබුනේ ටොන් 20 කි. දැන් මේ ප්‍රමාණය බෙදා දීමේ සියළුම කටයුතු කර ඉවර යි. අර කලින් කියූ වැඩ පිළිවෙල සාර්ථක වීම නිසා ගොවීන්ට ඔක්තෝබර් මස 15 තරමට පෙර බීජ අර්තාපල් පොළව යට කරන්නට ලැබිලා. වෙනදා වගේ පසු වෙවී ඉන්න උවමනාවක් නැහැ. කලට වේලාවට වගා කර ගන්න පුළුවන්. ඒක ඉතා වැදගත් වන්නේ ජනවාරි මාසයේ තුෂාරයෙන් බෝග බේරා ගන්නත් ඕනෑ නිසා.

## මල් වැවීම

**වෙළඳ පොළට මල් වැවීම:** දැන් පහත රට පොල් වගා කෙරෙන ප්‍රදේශවල සීඝ්‍රයෙන් කෙරෙන ව්‍යාපාරයක් වෙළඳ පොලට මල් වැවීම. ඇත්තවශයෙන් ම මේ ප්‍රදේශයේ ඕකිඩ් වගා කිරීමට දේශගුණය සලකනවිට ඉතාම සුදුසු ප්‍රදේශය හැටියට යි සලකන්නේ. ඇන්තූරියම් වගාව මැදරට ප්‍රදේශයෙහි වඩා සුදුසු හැටියට සලකන්නේ.

විදේශීය වෙළඳ පොලට උවමනා ඕකිඩ් වගී වැවීමේදී දේශීය ඕකිඩ් වර්ග වලට වඩා ආනයනය කළ මව් පැළ වලින් ලබාගත් විදේශීය ඕකිඩ් වගා වලින් ලබාගන්න මල් වැඩිය වැදගත්. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උද්භිද උද්‍යාන අංශයෙන් මේ පිළිබඳ පර්යේෂණ ද හා ලියාපදිංචි වූ වගා කරුවනට පැලැටි ද්‍රව්‍ය හා උපදෙස් සැපයීම ද කරනවා. එහි කුඩා පැල 25 ක් අඩංගු ඕකිඩ් මල් පෝච්චියක් රු. 15/= කට ද, ඇන්තූරියම් පැලයක් රු. 3/- කට ද ඒ අයට ලබාගත හැකි යි.

අද මේ මල් වගාව ලොකු කුඩා සමාගම් හා පෞද්ගලික වගා කරුවන් සමූහයක් සම්බන්ධ ව්‍යාපාරයක්ව ඇත. මේ වසර මුල දී කළ ගණන් බැලීමක් අනුව විශාල ප්‍රමාණයේ මල් වගා කරුවන් 20 ක්ද, මධ්‍යම ප්‍රමාණයේ මල් වගා කරුවන් 80 ක්ද, කුඩා හා ඉතා කුඩා මල් වගා කරුවන් 400 ක් පමණ ද, ඊට සම්බන්ධය. කීප දෙනෙක් එය පූර්ණ කාලීන ජීවනෝපාය හැටියට ද කරනු ලබයි. මේ අයගේ උවමනාවන් සපුරාලීමට ඕකිඩ් හා ඇන්තූරියම් පැලැටි වලට ඇති ඉල්ලුම පිළිබඳ තොරතුරු මෙසේ ය.

| | පැල |
|---|---|
| ඩෙන්ඩ්‍රෝබියම් | 1,00,000 |
| අරච්නිස් මාගියි | 1,95,000 |
| අරන්තරා ජේම්ස් ස්ටෝරිස් | 25,000 |
| අරන්ඩා වව්ස් | 10,000 |
| සෙම්ටෙරේට වැන්ඩා | 10,000 |
| ඔන්ඩිසියම් ගෝල්ඩන්ෂවර් | 25,000 |
| ඇන්තූරියම් | 1,00,000 |
| | 4,80,000 |

"ලක්මල් සැල" නැති නම් ශ්‍රී ලංකාවේ විදේශ මල් වර්ග හා ඕකිඩ් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය පිහිටුවා දැනට වසර ගණනාවක් වෙනවා. දැනට මෙහි සාමාජිකයින් සංඛ්‍යාව 1,200 ට අධික යි. එයට අයත් බම්බලපිටියේ පිහිටි වෙළඳ සැලින් ඉතා අඩු මිලට පැල, පෝර, බෙහෙත් වර්ග ලබා ගන්නට සලස්වා තිබෙනවා. මෙම සංගමයට අයත් මල් ගොවිපලක් නිට්ටඹුවේ අක්කර 10 ක භූමි භාගයක පිහිටුවා තිබෙනවා.

දැන් කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය නාත්තන්ඩිය, වෙන්නප්පුව, කටුගම්පොල යන ස්ථාන තුනක කුඩා ප්‍රමාණයේ ඕකිඩ් මල් වවන ගොවි පලවල් 1,000 ක් බැගින් ආරම්භ කිරීමට මූලික කටයුතු සලස්වා ගෙන යයි. මෙහි දී විශේෂයෙන්ම උගත් තරුණ තරුණියන්ට අවස්ථාවක් දීමට බලාපොරොත්තු වේ. සෙම්ටරේට වැන්ඩා, ජේම්ස්ටෝරි, මැගිට් යන වර්ග වල ඕකිඩ් පැල එහි දී වගා කරන්නට අදහස් කරන්නේ ය.